**Trial Monitoring report (නඩු විභාග අධීක්ෂණ වාර්තාව)**

**About the case (කුමන නඩුවක් සම්බන්ධයෙන් ද):** පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට තොරතුරු ලැබී තිබියදීත් එය පොලීසියට වසන් කළේ යැයි චෝදනා කරමින් මොහොමඩ් ඊබ්‍රහිම් ඇතුළු විත්තිකරුවන් 03 දෙනෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩුවකි.

**Case no (නඩු අංකය):** HC 3072/22

**Courts (අධිකරණය):** කොළඹ මහාධිකරණ අංක 1

**Date of hearing (නඩුව අසන ලද දිනය):** 2023 ජූලි මස 06 වන දින

**Author (s) of report (වාර්තාවේ කතෘ හෝ කතෘන්):** නීතිඥ මනුෂිකා කුරේ.

**1. Who was in courts:**

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s) (විනිසුරු හෝ විනිසුරුවරුන්)** | විනිසුරු නවරත්න මාරසිංහ මහතා | |
| **Attorney General's Dept. (නීතිපති දෙපාතර්මේන්තුව)** | නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ලක්මිණි ගිරිහාගම මහත්මිය | |
| **Police (CID / TID etc.) (පොලීසිය - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව/ත්‍රස්ත විමශර්න ඒකකය/ වෙනත්)** | | |
| **Accused / Suspects (චූදිත/ සැකකරුවන්)** | **1.** මොහොමඩ් යූසුෆ් මොහමඩ් ඊබ්‍රාහීම් <br> **2.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉජාස් අහමඩ් <br> **3.** මොහමඩ් ඊබ්‍රාහීම් ඉස්මයිල් අහමඩ් | |
| **Lawyers for accused / suspects (චූදිතයන් / සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | පෙනී සිටින ලද නීතිඥවරුන්ගේ නාමයන් සොයාගැනීමට නොහැකි විය. | |
| **Aggrieved party (අගතියට පත් පාශර්වය)** | | |
| **Lawyers for aggrieved party (අගතියට පත් පාශර්වය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥවරුන්)** | | |
| **Supporters of accused / suspects (චූදිතයන්ගේ / සැකකරුවන්ගේ ආධාරකරුවන්)** | | |

| | | |
|---|---|---|
| **Supporters of aggrieved party (අගතියට පත් පාශර්වයේ ආධාරකරුවන්)** | | |
| **Others (වෙනත් අය)** | | |

**2. What happened in the court hearing (උසාවි විභාගයේදී සිදු වූ දේ)?**

මෙදින උදැසන මෙම නඩුව කැඳවූ අවස්ථාවේ පස්වරු 2ට මෙම නඩුව කැඳවන බව අධිකරණයෙන් දන්වා සිටින ලදී. කෙසේ නමුත් නැවත පස්වරුවේ මෙම නඩුව සඳහා යාමට නොහැකි වන බව ජොෂ්ඨ නීතිඥ මහතාට දන්වා සිටින ලදී. ඒ අනුව පහත සටහන මාධ්‍යවේදී ෆසීර් මහතා විසින් ලබාදෙන ලද විස්තර ප්‍රකාරව සකස් කරන ලදී.

නඩුවට අදාළ ලේඛන සහිත ලිපි ගොනුවක් (නඩු ගොනුවක්) මෙම මහාධිකරණයට ඉදිරිපත් කරන ලෙස පෙර නඩු දිනදී විනිසුරුතුමන් නියෝග කර ඇත. ඒ අනුව මෙදින එම ලේඛන රජයේ නීතිඥතුමිය විසින් ඉදිරිපත් කර ඇත. එම ලේඛනයන්හි soft copy, CDයකට දමා විත්තිකරුවන්ට විවෘත අධිකරණයේදී ලබා දී ඇත. එමෙන්ම විත්තිකරුවන්ට පිටපත් සහිතව තවත් CD පටයක් අධිකරණයට ඉදිරිපත් කිරීම සිදුව ඇත. එම CD පටයේ දෙමටගොඩ පිපිරුමේ ස්ථානීය පරීක්ෂණ සිදු කරන ලද ඡායාරූප (කොළඹ උතුර පොලිස් ස්ථානීය පරීක්ෂණ කණ්ඩායම විසින් ගන්නා ලද ඡායාරූප) අන්තර්ගත බව සඳහන්ව ඇත.

පෙර නඩු දිනයේදී 3වන විත්තිකරු වෙනුවෙන් ඇප ඉල්ලීමක් සිදු කර ඇත. එහි නියෝගය මෙදින ලබා දී ඇත. මීත් පෙර අවස්ථා තුනකදීත් 3වන විත්තිකරු සම්බන්ධයෙන් ඇප ඉල්ලීම් සිදු කර ඇති බවටත්, එම ප්‍රථම අවස්ථාවේදී ඇප ප්‍රතික්ෂේප කළ විට ඇප ඉල්ලීම අභියාචනාධිකරණයට ඉදිරිපත් කිරීමක් සිදු කර ඇති බවටත්, අභියාචනාධිකරණයේදී එම ප්‍රතිශෝධන අයදුම්පත ඉල්ලා අස් කර ගැනීමක් සිදු කර ඇති බවටත්, අනතුරුව මහාධිකරණයෙන් කරන ලද ඇප ඉල්ලීම් ද්විත්වයම ප්‍රතික්ෂේප කර ඇති බවටත් සඳහන්ව ඇත. පළමු හා දෙවන විත්තිකරුවන්ට ඇප ලබා දීම සඳහා සුවිශේෂී කරුණු තිබූ බැවින් ඇප ලබාදුන් නමුත්, තුන්වන විත්තිකරුට ඇප දීමට තරම් සුවිශේෂී කරුණු නොමැත යන්න දක්වා මීට පෙර අධිකරණය දැරූ මතයම දැනටත් අදාළ වන බවද දක්වා ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

පූර්ව නඩු විභාගය සඳහා 2023 සැප්තැම්බර් මස 22 වන දිනට මෙම නඩුව කැඳවීමට නියම කරන ලදී.

**3. Any significant observations inside court room and outside? (උසාවි කාමරය තුළ සහ පිටත සැලකිය යුතු නිරීක්ෂණ තිබේද?) –**

**4. Next date & time (ඊළඟ දිනය සහ වේලාව):** 2023සැප්තැම්බර් මස 22 වන දින

**5. Media reports about the case on this date (මෙම නඩුව පිළිබඳ මාධ්‍ය වාර්තා):**